සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education NWP

08 | S | I

## දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020
## Second Term Test - Grade 13 - 2020

විභාග අංකය .............................

**කෘෂි විද්‍යාව I**

කාලය පැය දෙකයි

උපදෙස්
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

01. ලංකාවේ ඉහළම වී නිෂ්පාදනයක් ලබා දෙන දිස්ත්‍රික්ක වනුයේ,
    1. අම්පාර සහ කුරුණෑගල 2. පොළොන්නරුව සහ අනුරාධපුර 3. කුරුණෑගල සහ කෑගල්ල
    4. මොණරාගල සහ බදුල්ල 5. මොණරාගල සහ අම්පාර

02. යටත් විජිත සමයේ වැවිලි බෝගයක් ලෙස වගා කළ මේ වන විට වගා නොකරන බෝගය නම්,
    1. කරඳමුංගු 2. සාදික්කා 3. වල්දෙල් 4. වසාවාසි 5. සින්කෝනා

03. පාෂාණ පිළිබඳ පහත ප්‍රකාශ වලින් **නිවැරදි** වනුයේ,
    1. මැග්මා සනවී සිසිල්වීමෙන් සෑදෙන පාෂාණ විපරිත පාෂාණ ලෙස හැඳින්වේ.
    2. පාෂාණයකට නිශ්චිත රසායනික සංයුතියක් ඇත.
    3. ග්‍රැනයිට් යනු ආග්නේය පාෂාණයකි.
    4. පාෂාණ ජීර්ණයට සතුන්ගේ කුර ගැටීම බලනොපායි.
    5. පාෂාණ ජීර්ණය වී පස නිර්මාණය වීමට වසර පහක පමණ දිගු කාලයක් ගතවේ.

04. පාෂාණ රසායනික ජීර්ණයට ලක් වී සෑදෙන රතු පැහැති සංයෝගයකි.
    1. කැල්සියම් කාබනේට් 2. හීමටයිට් 3. ලිමොනයිට් 4. කෙඔලිනයිට් 5. කැල්සියම් බයිකාබනේට්

05. ප්‍රාථමික ඛණිජ පිළිබඳ පහත වගන්ති සලකා බලන්.
    A) ආග්නේය පාෂාණ ජීර්ණයෙන් ප්‍රාථමික ඛණිජ සෑදේ.
    B) පසේ වැඩිපුරම පවතින ප්‍රාථමික ඛණිජ වන්නේ ක්වෝට්ස් සහ පෙල්ඩ්ස්පාර් ය.
    C) 'මැටි' යන ද්විතීයික ඛණිජයයි.
    D) පසේ සාරවත් බවට වඩාත් විශාල බලපෑමක් සිදු කරන්නේ ද්විතියික ඛණිජය.
    ඉහත ප්‍රකාශ අතරින් **සත්‍ය** ප්‍රකාශ වන්නේ,
    1. A, B, C පමණි. 2. B, C, D පමණි. 3. A, C හා D පමණි.
    4. A, B හා D පමණි. 5. A, B, C, D සියල්ල සත්‍ය වේ.

06. මෙම උපකරණ පිළිබඳ **සත්‍ය** වගන්තිය / වගන්ති වනුයේ,



A) ආලෝක කාලසීමාව මැනීමට යොදා ගනී.

B) මෙහි වූ ද්වි ලෝහ පටි යුගලයක් මත සූර්ය විකිරණ පතිත වීමෙන් ඇතිවන උෂ්ණත්වය වෙනසෙහි දත්ත ලබා ගනී.

C) උපකරණයට ඇතුළත් කරන්නා වූ විශේෂිත සටහන් පත් මතට වීදුරු ගෝලය මගින් සූර්ය කිරණ නාභිගත කරයි.

1. A පමණි. 2. B පමණි. 3. C පමණි.
4. A හා B පමණි. 5. A හා C පමණි.

07. සාපේක්ෂ ආර්ද්‍රතාවය හා උත්ස්වේදන වේගය අතර සබඳතාවය මනාව දැක්වෙන ප්‍රස්තාරය වනුයේ,




08. කෘෂිකාර්මික පාංශු සංරක්ෂණ ක්‍රමයකි.

1. සමෝච්ච කාණු දැමීම 2. හෙල්මළු තැනීම 3. ගල්වැටි දැමීම
4. කාබනික ද්‍රව්‍ය යෙදීම 5. පස් වැටි දැමීම

09. 'රතු දුඹුරු පස' පිළිබඳ පහත වගන්ති අතරින් **සාවද්‍ය** වගන්තිය තෝරන්න.

1. $P^H$ අගය උදාසීන තත්වයට ආසන්නය. 2. වියළි කලාපය ආශ්‍රිත ප්‍රදේශවල ඇත.
3. වියළි විට ඉතා තදය, තෙත් වූ විට ඇලෙන සුළු වේ. 4. A කලාපයේ තිරුවානා ගල් තට්ටුවක් තිබේ.
5. ජල වහනය යහපත්ය.

10. බෝග ශාකවලට උපරිම පෝෂක අවශෝෂණයක් සිදුවන පාංශු උෂ්ණත්වය වනුයේ,

1. $10^0C - 16^0C$ 2. $16^0C - 24^0C$ 3. $24^0C - 33^0C$ 4. $33^0C - 43^0C$ 5. $43^0C - 50^0C$

11. ශාක පෝෂක අවශෝෂණය පිළිබඳ පහත ප්‍රකාශ වලින් **නිවැරදි** වනුයේ,

1. සාන්ද්‍රණ අනුක්‍රමණය තුළින් පෝෂක අවශෝෂණය සක්‍රීය අවශෝෂණයයි.
2. නයිට්‍රේට්. සල්පේට් වැනි අයන පහසුවෙන් ම අක්‍රීය අවශෝෂණය මගින් ශාක ලබා ගනී.
3. සක්‍රීය අවශෝෂණය සඳහා ATP ශක්තිය වැය නොවේ.
4. සයනයිඩ් ඇතිවිට අක්‍රීය අවශෝෂණය නවතී.
5. අක්‍රීය අවශෝෂනයට ATP ශක්තියේ බලපෑමක් ඇත.

12. මෙම රූපයෙන් දැක්වෙනුයේ,



1. ජෝන් පුල්ලේ ගොඩ බීජ වප්කරය 2. වික්‍රමසේකර මඩ බීජ වප්කරය
3. FMRC පේළි හතරේ බීජ වප්කරය 4. FMRC දෙපේළි ගොඩ බීජ වප්කරය
5. බෙර රෝද හා දම්වැල් බීජ වප්කරය

13. අඳින වර්ගයේ අත් උදලු නොහොත් 'හෝ (hoe) උපකරණවල' භාවිතයන් පිළිබඳ **නිවැරදි** ප්‍රකාශ / ප්‍රකාශය වන්නේ,

A) ගොඩ බෝගවල වල් නෙලීම

B) මඩ වී ගොවිතැනෙහි පස පෙරළීම

C) පස බුරුල් කිරීම හා පොහොර පසට මිශ්‍ර කිරීම.

1. A හා B පමණි. 2. B හා C පමණි. 3. A හා C පමණි. 4. A පමණි. 5. C පමණි.

14. තවාන් පැළ නඩත්තුවේදී සැලකිය යුතු කරුණක් වන්නේ,
   1. පාංශු තෙතමන මිනුම්, වාෂ්පීකරණ උත්ස්වේදන අවශ්‍යතාවයන් තවානක් සඳහා ජල ප්‍රමාණය තීරණයට වැදගත් මිනුම් නොවේ.
   2. තවානක් තුළ අඩු ආම්ලික තත්ත්වයක් පවත්වා ගැනීම $P^H 5.5 - 6.5$ තවාන් පැළ සඳහා හිතකර වේ.
   3. පැළ තවාන් තුළ පවතින මුළු කාලය තුළ දැඩි හිරු රැසින් ආරක්ෂා කිරීම සඳහා වසුන් යෙදීම සුදුසු වේ.
   4. තවාන් පළිබෝධ පාලනයේදී වඩාත්ම සුදුසු වන්නේ රසායනික පළිබෝධ පාලන ක්‍රම යොදා ගැනීම වේ.
   5. තවාන් සඳහා අර්ධ ස්ථිර ස්ප්‍රින්කර් ක්‍රම භාවිතය ජලය අපතේ යාම අඩු කළ ද අවශ්‍ය පාංශු තෙතමනය ලබා දීමට අපොහොසත් වේ.

15. ජෛව විද්‍යාත්මක පළිබෝධ පාලනයට යොදාගන්නා විලෝපික කෘමියෙකු වන්නේ,
   1. එපිලැග්නා 2. අවුලකපෝරා 3. තණකොළපෙත්තා
   4. මකුළුවා 5. ලේඩි බර්ඩ් කුරුමිණියා

16. පහත රෝග අතරින්, බැක්ටීරියා මගින් පමණක් ඇති කරනු ලබන රෝග වන්නේ,
   1. පත්‍ර විචිත්‍රය හා සනාල මැලවීම. 2. සනාල මැලවීම හා මෘදු කුණු වීම.
   3. පත්‍ර විචිත්‍රය හා ඇන්ත්‍රැක්නෝස් 4. පත්‍ර කහ වීම හා සනාල මැලවීම
   5. පත්‍ර විචිත්‍රය හා කොළ පුල්ලි රෝගය

17. ඒකාබද්ධ 'පළිබෝධ මර්ධනයේ ප්‍රධාන අරමුණ වන්නේ,
   1. ක්ෂේත්‍රයට පළිබෝධයන් ඇතුලු වීම වැළැක්වීමය.
   2. පළිබෝධකයාගේ ස්වභාවික සතුරන් වැඩිකිරීමය.
   3. පළිබෝධකයා සම්පූර්ණයෙන් විනාශ කිරීමය.
   4. පළිබෝධ ගහණය ආර්ථික හානිදායක මට්ටමට අඩුවෙන් පවත්වා ගැනීමයි.
   5. පළිබෝධකයාගේ ද්විතියික කාරකයින් විනාශ කිරීමයි.

18. අපරිනත කොම්පෝස්ට්වල ලක්ෂණයක් නොවන්නේ,
   1. දිලීර (පුස්) වැඩී තිබීම. 2. අධිකව කාබනික අම්ල තිබීම. 3. $P^H$ අගය අවම වීම.
   4. $P^H$ අගය ඉතා වැඩි වීම 5. ලවණ සාන්ද්‍රණය අධික වීම.

19. ජල සම්පාදයේ අරමුණක් සේ සැලකිය නොහැකි කරුණ වන්නේ,
   1. බෝග වර්ධනය සඳහා 2. අල බෝග අස්වනු නෙලීම සඳහා 3. බිම් සැකසීම සඳහා
   4. පසේ ලවණතාව ඉවත් කිරීම සඳහා 5. බීජ ව්‍යාප්තිය සඳහා

20. කෘෂිකාර්මික කටයුතු සඳහා ගංගා ඇළ දොළ යන ජල ප්‍රභව භාවිතා කිරීමේදී පැන නගින ගැටළුවක් නොවන්නේ,
   1. පිරිවැය වැඩිවීම 2. අපද්‍රව්‍ය සහිතවීම.
   3. අධික වර්ෂාකාලයකදී ජල ලබා ගැනීම අපහසු වීම. 4. දිලීර වැනි රෝග කාරක ව්‍යාප්තිය
   5. බෝගය සඳහා අවශ්‍ය ජල ප්‍රමාණයම ලබාගැනීමට හැකිවීම.

21. රූපයේ දැක්වෙන්නේ,



   1. ජලවහනය සඳහා යොදාගන්නා සමාන්තර කානු පද්ධතියකි.
   2. පෘෂ්ඨීය හෝ උප පෘෂ්ඨීය ජල වහන කාණු සාදන ග්‍රිඩ් අයන් ක්‍රමයේ කානු පද්ධතියකි.
   3. උප පෘෂ්ඨීය ජල වහනය සඳහා යොදාගන්නා ග්‍රිඩ් අයන් ක්‍රමයේ කානු පද්ධතියකි.
   4. ජල සම්පාදනය සඳහා යොදා ගන්නා ස්වාභාවික කානු පද්ධතියකි.
   5. පෘෂ්ඨීය ජලවහන කානු සාදන ක්‍රමයකි.

22. ඒක බීජ පත්‍රී බීජයක,
   1. පැහැදිලිව දක්නට ඇති බීජ පත්‍ර එකකට වඩා ඇත.
   2. භ්‍රෑණපෝෂයක් නොමැති අතර ආහාර බීජ පත්‍ර වල සංචිතව ඇත.
   3. ඵලාවරණය බීජය සමඟ හොඳින් තදින් බැඳී ඇති නිසා කාරියොප්සයක් ලෙස නම් ලබා ඇත.
   4. අනුද්වාරය හා බීජ ලපය සහිත බීජාවරණයකින් ආවරණයවී ඇත.
   5. මෙහි වූ ඵලාවරණ වර්ථිකාව නම් වන අතර එය බීජාග්‍රපය තුළ ඇත.

23. බීජ මගින් ශාක ප්‍රචාරණය පිළිබඳ වඩාත් **නිවැරදි** වන්නේ,
   1. මෙමගින් බිහිවන්නා වූ දුහිතෘ ශාක මව් ශාකයට වෙනස් ගුණ දක්වන බැවින් අස්වැන්න තීරණය පහසුය.
   2. මෙම ක්‍රමයෙන් ලබා ගන්නා වූ දුහිතෘ පැල මේරීමට ගතවන කාලය වර්ධක ප්‍රචාරණයට සාපේක්ෂව අඩුය.
   3. ජලය, සුළඟ, සතුන් ආදී ව්‍යාප්තකාරක මගින් මෙම ක්‍රමයෙන් බීජ ව්‍යාප්තිය සිදුවන නිසා විශාල ප්‍රදේශයක ව්‍යාප්තවේ.
   4. මෙම ක්‍රමවේදය සෑම බෝගයකටම පාහේ යොදා ගත හැකි සාර්ථක ප්‍රචාරණ ක්‍රමයකි.
   5. නව ප්‍රභේද ඇති කර ගැනීමේදී මෙම ක්‍රමයේ දී අනෙකුත් දියුණු අභිජනන ක්‍රමවේද වලට සාපේක්ෂව වියදම් දැරීමට සිදු වේ.

24. පටක රෝපණයේදී පෝෂක මාධ්‍යය පිළියෙළ කිරීමේදී,
   1. බහුලව භාවිතා වන ශක්ති ප්‍රභවය වන්නේ ග්ලූකෝස්ය.
   2. කිණක වර්ධනය උත්තේජනය සඳහා ඔක්සීන් හා සයිටොකයිනින් සම ප්‍රමාණවලින් යොදයි.
   3. බහුලවම භාවිතා වන ඝනීකාරකය වන ඒගාර් සත්ව ඇටකටු මඟින් නිපදවා ගනී.
   4. ආකලන ද්‍රව්‍ය එක් කිරීමෙන් පෝෂක මාධ්‍යයේ රසය හා වර්ණය වර්ධනය වේ.
   5. අකාබනික පෝෂක එකතු කරනුයේ කාබනික පෝෂක හිඟ වූ විට පමණි.



25. A ස්වාභාවික ශාක ප්‍රචාරණ ව්‍යුහයකි. B ලිංගික ප්‍රචාරණ ව්‍යුහයකි.
   C ගහල, හබරල මේ සඳහා උදාහරණ වේ. D ඉගුරු, කහ මේ සඳහා උදාහරණ වේ.
   E මෙහි කොටස් වෙන් කොට සිටුවීම සිදු කරයි.

   ඉහත රූපයට සම්බන්ධව ඉහත පද ගලපන්න.
   1. A හා C සත්‍ය වන අතර එකිනෙකට ගැලපේ.
   2. B ප්‍රකාශය පමණක් රූපය හා ගැලපේ.
   3. B හා E සත්‍ය වන අතර එකිනෙක ගැලපේ.
   4. A හා D සත්‍ය වන අතර එකිනෙක ගැලපේ.
   5. ඉහත රූපයට හා කිසිදු ප්‍රකාශයක් නොගැලපේ.

26. ප්‍රභාසංස්ලේෂණ ශීඝ්‍රතාවය ඉහළ නැංවීමේදී,
   1. $CO_2$ සාන්ද්‍රණය අනෙකුත් අභ්‍යන්තර සාධක සීමාකාරී වන තෙක් යම් මට්ටමක් දක්වා ඉහළ නැංවිය යුතුය.
   2. $CO_2$ සාන්ද්‍රණය අඛණ්ඩව සීමාවකින් තොරව ඉහළ නැංවිය යුතුය.
   3. $CO_2$ සාන්ද්‍රණය වැඩි කළද හරිතාගාර වගාවන්හිදී වූ සංවෘත පරිසරය නිසා සාර්ථක ප්‍රතිඵල නොදේ.
   4. බොහෝ විට $CO_2$ සාන්ද්‍රණය මඩ බෝග සඳහා සීමාකාරී සාධකයක් ලෙස ක්‍රියා කරයි.
   5. වියළි කලාපයේ $(C_4)$ ශාක වගාවෙන් $CO_2$ සීමාවකින් තොරව ලබා ගත හැකිය.

27. පහත වගුවේ දක්වා ඇත්තේ පටක රෝපණ විද්‍යාගාරයක මූලික කොටස් කිහිපයක් හා ඒ සම්බන්ධ තොරතුරු වේ.

| | පටක රෝපණ විද්‍යාගාරයක මූලික කොටස් | විස්තරය |
|---|---|---|
| A | පිරිසිදු කිරීමේ කාමරය (Washing Room) | මව් ශාකය සංස්ථාපනය සඳහා පිරිසිදු කිරීම. |
| B | රෝපණ මාධ්‍ය පිළියෙළ කරන කාමරය (Media Preparation room) | මෙහි අනවරත ප්‍රවාහ කැබිනෙට්ටුව හා පීඩානතාපකය ඇත. |
| C | රෝපණ කාමරය (Culture Room) | මෙහි උෂ්ණත්වය 22 - $28^0$c අර්ද්‍රතාවය 60 - 75% අතර විය යුතුය. |

ඉහත ප්‍රකාශ අතරින් කරුණු **නිවැරදිව** ගලපා ඇත්තේ,

1. A පමණි. 2. B පමණි. 3. C පමණි. 4. A හා B පමණි. 5. A හා C පමණි.

28. දඬු කැබලි මඟින් ශාක ප්‍රචාරණයේදී,
1. උපරිම පර්ව 1 - 2 ක් ඇති අතු කැබලි යොදා ගනී.
2. දඬු කැබලිවල පහළ කෙළවර $45^0$ ආනතවද ඉහළ කෙළවර පැතලිවද කපා ගනී.
3. රෝස, ක්‍රෝටන් වැනි ශාක ප්‍රචාරණය සඳහා පිටුවිය යුත්තේ ලා දඬු කැබලිය.
4. දඬු කැබලිවල ඉහළ කෙළවර පැතලිවද පහළ කෙළවර පත්‍රවල අඩක්ද කපා ගනී.
5. ශාක මුල් ඇද්ද වීම උත්තේජනය සඳහා ෆ්ලෝරිජින් වැනි හෝමෝනයක් යොදා ගනී.

29. *Bacillus thuringiensis* යනු,
1. ශාක රෝග කාරක දිලීරයකි. 2. ශාක රෝග කාරක බැක්ටීරියාවකි.
3. $N_2$ තිරකරන බැක්ටීරියාවකි. 4. පලිබෝධ පාලනයට යොදාගන්නා දිලීරයකි.
5. පළිබෝධ පාලනයට යොදාගන්නා බැක්ටීරියාවකි.

30. වල්පැළෑටි කිහිපයක් පහත දැක්වේ. ඒ ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A ඇටවරා *(Panicum repens)* B කළාඳුරු *(Cyperus rotundas)*
C පාතිනියම් *(parthenium hysteropborus)* D වතුපාළු *(Mikania cordata)*
E ගඳපාන *(Lantana camara)*

ඉහත වල්පැළෑටි අතුරින් ආක්‍රමණශීලි වල්පැළෑටි වන්නේ,

1. A හා B පමණි. 2. A හා C පමණි. 3. C හා D පමණි.
4. A හා E පමණි. 5. B හා C පමණි.

31. තෘණ, පන් හා පළල් පත්‍ර වල් පැළෑටි පිළිවෙලින්,
1. A, B හා D වේ. 2. B, A හා C වේ. 3. B, C හා D වේ.
4. A, C හා D වේ. 5. A, E හා B වේ.

32. පාතනෝච්ඡලනය සඳහා දායක වන්නා වූ ශාක හොමෝනය වන්නේ,
1. සයිටොකයිනින් 2. ඔක්සීන් 3. ගිබරලීන 4. ඇබ්සිසික් අම්ලය 5. එතිලීන්

33. දියගත වගාව (hydrophonics) යනු,
1. නිමග්න (Submerged) ජලජ ශාක වවන ක්‍රමයකි. 2. පාවෙන ජලජ ශාක වවන ක්‍රමයකි.
3. නිර්පාංශු වගා ක්‍රමයකි. 4. ජලය තුළ ශාක වවන ක්‍රමයකි.
5. මත්සයින්ට ආහාර ලෙස වවන ක්‍රමයකි.

34. බහුගුණකතාවය යනු, පෞද්ගලිකයකු තුළ,
1. අමතර X වර්ණ දේහයක් තිබීමය
2. වැදගත් ජානවල අමතර පිටපතක් තිබීමය.
3. අමතර එක් වර්ණදේහයක් පිහිටීමය.
4. වර්ණදේශවල සම්පූර්ණ අමතර කට්ටල තිබීමය.
5. අමතර X හා Y වර්ණදේහ පිහිටීමය.

35. ආහාර පරිරක්ෂණය සම්බන්ධයෙන් වූ පහත ප්‍රකාශ අතරින් **අසත්‍ය** ප්‍රකාශය වන්නේ,
1. දුම් ගැසීමෙන් ආහාර පරිරක්ෂණය වේ.
2. යෝගට් යන් ඇසිටික් අම්ල පැසවීම මගින් පරිරක්ෂණය කළ ආහාරයකි.
3. ගොරකා ආහාර පරිරක්ෂණයට යොදාගත හැකි ස්වභාවික ප්‍රභවයකි.
4. ලැක්ටික් අම්ල පැසවීමේදී ආහාරවල $P^H$ අගය ක්ෂුද්‍ර ජීවිගේ වර්ධනයට නුසුදුසු තත්වයට පත්කරයි.
5. $NaNO_3$ යනු මාංශමය ආහාර පරිරක්ෂණයට යොදාගන්නා කෘතිම පරිරක්ෂණයකි.

36. ගබඩාවේදී පසු අස්වනු හානි අවම කර ගැනීමේ අපේක්ෂවෙන් ගොවියෙක් සිය අස්වැන්නට කොහොඹ හා දෙහි කොළ එක් කළේය. මෙය සිදු කිරීමෙන් ඔහු අවම කර ගැනීමට අපේක්ෂා කළේ,
1. භෞතික හානිය
2. ජෛව රසායනික හානිය
3. ජෛව විද්‍යාත්මක හානිය
4. භෞතික හා ජෛව රසායනික හානිය
5. භෞතික හා ජෛව විද්‍යාත්මක හානිය

37. පසු අස්වනු හානිය ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම නිෂ්පාදනයේ ප්‍රධාන ගැටළුවක් බවට පත් වී ඇත. මෙය අවම කල හැක්කේ,
A නිසි පරිනත අවධියේදී අස්වනු නෙලීමෙනි.
B ගොවිපළ තුලදීම අලෙවි කිරීමෙනි.
C උචිත ඇසුරුම් ද්‍රව්‍ය භාවිතා කිරීමෙනි.
D කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතයෙනි.
ඉහත ප්‍රකාශ අතරින් කරුණු **නිවැරදිව** ගලපා ඇත්තේ,
1. A හා B පමණි.
2. A හා C පමණි.
3. A හා D පමණි.
4. B හා C පමණි.
5. B හා D පමණි.

38. HAACP යනු
1. ආහාර නිෂ්පාදන ප්‍රවර්ධනයේදී වැදගත්වන තත්ත්ව පද්ධතියකි
2. ආහාර නිෂ්පාදන කර්මාන්ත ශාලා තුළදී භාවිතා වන තත්ත්ව පද්ධතියකි.
3. ආහාර නිෂ්පාදන අලෙවියේදී සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කරන තත්ත්ව පද්ධතියකි.
4. නිෂ්පාදන ක්‍රියාවලියදී ඇතිවිය හැකි අවදානම් පාලනය කරන තත්ත්ව පද්ධතියක
5. ආහාර නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිතා වන ප්‍රමිතිකරණ සහතිකයකි.

39. ආහාර පරිරක්ෂණය පිළිබඳව දී ඇති පහත වගන්ති අතරින් **සත්‍ය** වගන්තිය වන්නේ,
1. පැස්චකරීකරණයේදී ආහාරයක වූ සියළුම ක්ෂුද්‍රජීවීන් විනාශකරයි.
2. ජීවානුහරණයට ලක් කිරීමේදී ආහාර $101^0C$ උෂ්ණත්වයේ විනාඩි 15 ක් තබයි.
3. පැස්චරීකරණය කළ ආහාර සාමාන්‍ය කාමර උෂ්ණත්වයේ ගබඩා කළ හැක.
4. බ්ලාන්චිකරණයේදී ආහාරයක අඩංගු ස්වභාවික එන්සයිම වර්ග අක්‍රිය වේ.
5. බ්ලාන්චිකරණය සඳහා හුමාලය භාවිතා කළ නොහැක.

40. වෙළඳපොලේ ඇති ත්‍රිත්ව ලැමිනිකෘත ඇසුරුම් තුළ පවතින ආහාර පරිරක්ෂණය කර ඇත්තේ,
1. වැඩි උෂ්ණත්වය කෙටි කාල ක්‍රමයටය.
2. අඩු උෂ්ණත්වය දිගු කාල ක්‍රමයටය.
3. උපරිතාප ක්‍රමයට
4. ශීත වියළීමේ ක්‍රමයට
5. අධිශීත කිරීමේ ක්‍රමයටය.

41. සත්ව ආහාර සඳහා සහල් නිවුඩු (rice Polish) යොදා ගැනෙන්නේ,
1. ශක්ති පරිපූරකයක් ලෙසය.
2. ප්‍රෝටීන පරිපූරකයක් ලෙසය.
3. ඛණිජ පරිපූරකයක් ලෙසය.
4. විටමින පරිපූරකයක් ලෙසය.
5. කාබෝහයිඩේට් පරිපූරකයක් ලෙසය.

42. සංකීර්ණ ආමාශයේ විශාලතම කුටීරය,
   1. විතංශිකාවයි.   2. බහුනැමියයි   3. ජඨරාශයයි.
   4. අන්නස්‍රෝත ඇලියයි.   5. රූමනය

43. ගොවිපළ සතුන්ගේ වර්ධනය සහ නිෂ්පාදනය කෙරෙහි බලපාන වඩාත් වැදගත් පාරිසරික සාධකය වන්නේ,
   1. පරිසර උෂ්ණත්වය   2. සාපේක්ෂ ආර්ද්‍රතාවයයි   3. දිවා කාලයේ දිගයි.
   4. සුළගේ දිශාවයි.   5. වර්ෂාපතනය සහ එහි ව්‍යාප්තියයි.

44. සයිලේජ් සෑදීම යනු,
   1. වියලි ආකාරයෙන් තෘණ සංරක්ෂණය කරන ක්‍රමයකි.
   2. කෘත්‍රිම ද්‍රව්‍ය එකතු කිරීම මගින් තෘණ සංරක්ෂණ කරන ක්‍රමයකි.
   3. කිරි ගවයින් සඳහා පිළියෙළ කරන සමතුලිත ආහාරයකි.
   4. ගව නැම්බියන් සඳහා පිළියෙළ කරන සමතුලිත ආහාරයකි.
   5. තෙත් ආකාරයෙන් තෘණ සංරක්ෂණය කරන ක්‍රමයකි.

45. කිරි ගව දෙනකගේ කිරි මුදා හැරීම සඳහා බලපාන හෝර්මෝනය වනුයේ,
   1. ඉන්සියුලින් ය.   2. ඊස්ට්‍රජන් ය.   3. ඔක්සිටොසින් ය.
   4. ප්‍රෝලැක්ටීන් ය.   5. ප්‍රොජෙස්ටරෝන් ය.

46. තන්තු අධික ආහාරයක් දුන් විට රූමනයේ දක්නට ලැබෙන ප්‍රමුඛතම වාෂ්පශීලී මේද අම්ලය වනුයේ,
   1. ප්‍රොපියොනික් අම්ලය   2. බියුට්‍රික් අම්ලය   3. ෆෝමික් අම්ලය
   4. ඇසිටික් අම්ලය   5. ලැක්ටික් අම්ලය

47. ගොවිපළ සතුන්ගේ ආහාර ජීර්ණ ක්‍රියාවලිය පිළිබඳ වඩාත් **නිවැරදි** ප්‍රකාශය වනුයේ,
   1. ආහාරයේ ඇති ප්‍රෝටීන ජීර්ණයට ආමාශයෙන් ට්‍රිප්සින් ස්‍රාවය වේ.
   2. සංකීර්ණ ආමාශය තුළ එන්සයිමීය ජීර්ණය සිදු නොවේ.
   3. කිකිළිගේ වටනය තුළ ආහාරවල එන්සයිමීය හා යාන්ත්‍රික ජීර්ණය සිදුවේ.
   4. කුකුළන් තුළ රූමනය නොමැති බැවින් ක්ෂුද්‍ර ජීවී ජීර්ණයට උපකාරී වනු පිණිස උණ්ඩුක දෙකක් පිහිටා ඇත.
   5. රූමනය තුළ සිදුවන ක්ෂුද්‍ර ජීවී ජීර්ණය මහා අන්ත්‍රයේ සිදුවන එම ක්‍රියාවලියට හාත්පසින්ම වෙනස් ය.

48. 'ඔස්ට්‍රලොප්' යන කුකුළු වර්ගය,
   1. ඉංග්‍රීසි පන්තියට අයත් බර වර්ගයකි.
   2. ඇමරිකානු පන්තියට අයත් බර වර්ගයකි.
   3. මධ්‍යධරණී පන්තියට අයත් සැහැල්ලු වර්ගයකි.
   4. ඇමරිකානු පන්තියට අයත් ද්විකාර්ය වර්ගයකි.
   5. ආසියානු පන්තියට අයත් මාංශ ආකාරයේ වර්ගයකි.

49. අනුපූරක භාණ්ඩ යනු,
   1. තරඟකාරී භාණ්ඩය.   2. සාමාන්‍ය භාණ්ඩයකි.
   3. විවිධ උපයෝගිතා සහිත භාණ්ඩයකි.   4. වෙළඳ භාණ්ඩයකි.
   5. එකට පරිභෝජනය කළ යුතු භාණ්ඩයකි.

50. ප්‍රශස්ත සම්පත් සංයෝජනයේ වැදගත්කම වන්නේ,
   1. නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීමය.
   2. නිෂ්පාදන ක්‍රියාවලිය සංකලනය කිරීමය.
   3. නිෂ්පාදන ක්‍රියාවලියේදී සම්පත් උපයෝගීකරණය කිරීමය.
   4. ඒකක නිෂ්පාදනයක වියදම අඩු කිරීමය.
   5. සම්පත් විවිධ නිෂ්පාදන වල යෙදවීමය.